# නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින තනතුරු සඳහා

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරීන් ( සිංහල මාධ්‍ය)

## කොන්ත්‍රාත් පදනමින් සේවයේ යොදවා ගැනීම

නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරීන් ( සිංහල මාධ්‍ය) කොන්ත්‍රාත් පදනමින් සේවයේ යොදවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2020.11.27 දින වේ.

| අනු අංකය | තනතුර | ශ්‍රේණිය | සේවා ස්ථානය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | I | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව , නැගෙනහිර පළාත | 01 |
| 2 | සහකාර / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | III / II | අධ්‍යාපන අමාත්‍යාංශය , නැගෙනහිර පළාත | 01 |
| 3 | සහකාර / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | III / II | කලාප අධ්‍යාපන කාර්යාලය, ත්‍රිකුණාමලය | 01 |
| 4 | සහකාර / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | III / II | කලාප අධ්‍යාපන කාර්යාලය, ත්‍රිකුණාමලය උතුර | 02 |
| 5 | සහකාර / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | III / II | කලාප අධ්‍යාපන කාර්යාලය, කන්තලේ | 02 |
| 6 | සහකාර / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | III / II | කලාප අධ්‍යාපන කාර්යාලය, මහඔය | 02 |
| 7 | සහකාර / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | III / II | කලාප අධ්‍යාපන කාර්යාලය, දෙහිඅත්තකණ්ඩිය | 02 |

### 1. බඳවා ගැනීමේ ක්‍රමය

මෙම අයදුම්පත් කැඳවීමට අනුව අයදුම්පත් යොමු කරන අයදුම්කරුවන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය සහ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් ගේ නිර්දේශය මත විශ්‍රාමිකයින් නැවත සේවයට බඳවා ගැනීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 ද 2019.10.10 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2019 ද අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. බඳවා ගනු ලබන කාලය මාස 12ක උපරිමයකට හෝ තනතුරු පුරප්පාඩු සඳහා ස්ථිර නිලධාරියකු පත්කරන තෙක් යන දිනයන් අතරින් පළමුව එළඹෙන දිනය දක්වා වේ.

### 2. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි 3 වන වගන්තිය අනුව වැටුප තීරණය කරනු ලැබේ.

### 3. කායික සුදුසුකම්

මෙම පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයකින් යුතු බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකුගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

### 4. අයදුම් කිරීමේ ක්‍රමය

**4.1.** මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 (සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.0 දක්වා පළමු පිටුවටද, අංක 6.0 සිට 8.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

**4.2.** **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක. එසේම අයදුම්කරුවන් තම සුදුසුකම් සනාථ කිරීමට අදාල සියලු සහතිකවල ඡායා පිටපත් අයදුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය.

**4.3.** අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන අයදුම්කරු අවසන් වරට සේවයේ යෙදී සිටි ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතු අතර අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු නිවැරදි බවට ඔහුගේ පූර්ව දෙපාර්මේන්තුවේ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**4.4.** නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2020.11.27** වන දිනට හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලෙන් එවන ලද අයදුම්පත් නැතිවුවහොත් ඒ පිළිබඳ වගකීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ. **(අයදුම්පත් ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැලකිය යුතුය.)**

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත,
අංකඃ 198, ඇතුල් වරාය පාර, ත්‍රිකුණාමලය

**4.5.** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **AD/SLEAS/2020/03/Rec** ලෙස සඳහන් කළ යුතුය.

**5.** සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

**6.** තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

**7.** මෙම දැන්වීමෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම සම්මුඛ පරීක්ෂණය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරු පුරප්පාඩුව පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලයද නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමිය සතු වේ.

එම්.වයි.සලීම්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.
13.11.2020